රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 03/ 2015

මගේ අංකය:PSC/DP/08/GEN/2013

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,

අංක 177, නාවල පාර,

නාරාහේන්පිට,

කොළඹ 05.

2015 මැයි මස 25 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ

දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

<u>විනය දඬුවම් වශයෙන් වැටුප් වර්ධක විලම්භනය කිරීම</u>

විනය දඬුවමක් වශයෙන් වැටුප් වර්ධක විලම්භනය කිරීමේදී එම දඬුවම ක්‍රියාත්මක කළ යුතුවන නිශ්චිත දිනය පිළිබඳව තීරණය කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති ගැටලු නිරාකරණය කිරීම සඳහා පහත දැක්වෙන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

02. ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 23:9 උප වගන්තිය අනුව විනය දඬුවමක් පැන වූ විට එය බලාත්මක විය යුත්තේ චූදිත නිලධාරියා අදාළ වරද සිදු කළ දින සිට ක්‍රියාත්මක වන පරිදිය.

03. ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 14:12 උප වගන්තිය අනුව, වැටුප් වර්ධක ගෙවීම අත්හිටවනු ලබන්නේ චෝදනා පත්‍රයක් නිකුත් කළ පසුව බැවින් වරද කළ දිනයේ සිට චෝදනා පත්‍රය නිකුත් කරනු ලබන දිනය දක්වා කාලය තුළ යම් නිලධාරියකු වැටුප් වර්ධක උපයාගනු ඇත.

04. යම් නිලධාරියකු වරද සිදු කළ දින සිට එසේ වැටුප් වර්ධක උපයා ගෙන ඇතත්, පනවා ඇති විනය දඬුවම වැටුප් වර්ධක විලම්භනය කිරීමක් නම්, එවැනි අවස්ථාවක දී දඬුවම ක්‍රියාත්මක

කිරීම ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 23:9 උප වගන්තිය ප්‍රකාරව සිදු කළ යුතු බව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2013 මගින් සංශෝධිත ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 24:6 උපවගන්තිය මගින් දක්වා ඇත.

05. ඒ අනුව ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ 23:9 උප වගන්තියේ විධිවිධාන ප්‍රකාර, චූදිත නිලධරයා වරද කළ දින සිට ම විනය දඬුවම ක්‍රියාත්මක කළ යුතුය. යම් හෙයකින් චූදිත නිලධරයා වරද කළ දින සිට චෝදනා පත්‍රය නිකුත් කරනු ලබන දිනය දක්වා කාලය තුළ ඔහුට වැටුප් වර්ධක ලබා දී තිබුණේ නම්, ඔහුට දඬුවම් පැමිණවීම පිණිස විලම්භනය කරනු ලබන වැටුප් වර්ධක සංඛ්‍යාව ඔහු වරද කළ දින සිට ගණනය කර ඔහුගේ වැටුප සංශෝධනය කළ යුතුය.

06. විනය නියෝගයේ සඳහන් වැටුප් වර්ධක ගණන විලම්භනය කළ පසුව එළඹෙන දින සිට සතුටුදායක සේවා කාලය ගණනය කළයුතු අතර එය රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 186 හි විධිවිධානවලට යටත්ව ගණනය කළ යුතු වනු ඇත.

07. තව ද, විනය නියෝගයේ කොටසක් වශයෙන් වැඩ තහනම් කර තිබූ කාල පරිච්ඡේදය සඳහා හිඟ වැටුප් නොගෙවීමට නියෝග කර ඇති අවස්ථාවක දී නිලධාරියාගේ වැටුප් වර්ධක සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 24:7 උප වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ටී.එම්.එල්.සී.සේනාරත්න

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

පිටපත්: පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්